# අපේ වගකීම් ලබ්ධියට පැවරීම

ලබ්ධිය හෙවත් ලිබිඩෝ යන්න ද සංකල්පයක් ලෙස ගත්කල උඩු සිතෙහි නිර්මාණයක් වෙයි. අප යම් සංකල්ප පිළිබඳ සවිඥානික වන්නේ ද ඒ සියළු සංකල්ප උඩු සිතෙහි නිර්මාණ වෙයි. මෙයින් අදහස්කෙරෙන්නේ යටි සිතෙහි සංකල්ප නැති බවක් නො වෙයි. එහෙත් යටි සිතෙහි සංකල්ප පිළිබඳ අපි සවිඥානික නො වෙමු. යටි සිත උඩු සිතට වඩා සංකීර්ණ වෙයි. යටි සිත සිතන්නේ කෙසේ දැයි අප නොදන්නේ අප ඒ පිළිබඳ සවිඥානික  නොවන බැවින් ය. එහෙත් මෙහි දී අවධාරණය කළයුතු කරුණක් වෙයි. අප සවිඥානික අවස්ථාවල දී යටි සිත මෙන් ම උඩු සිත ද ක්‍රියාකරන බවත් උඩු සිත හා යටි සිත අතර යම් සන්නිවේදනයක් වන බවත් ය.

ලබ්ධිය යන සංකල්පයේ ඇති ප්‍රධාන ම දුර්වලකම නම් කලින් සඳහන්කර ඇති පරිදි ඒ ආත්මවාදී වීම ය. ලකාන් වැනි බටහිර මනෝ විශ්ලේෂකයන්ට අනුව ලබ්ධිය දිගින් දිගට ම පවත්නා දෙයක් වෙයි. එය නැතිවන්නේ මරණයත් සමග යැයි උපකල්පනය කළ හැකි ය. ඒ මරණයත් සමග සියල්ල කෙළවර වන්නේ ය යන පදනමින් ය. එහෙත් මරණයෙන් මතු ආත්මය ස්වර්ගයට හෝ වෙනත් තැනකට හෝ යන්නේ නම් ලබ්ධිය ද ඒ සමග යන්නේ යැයි උපකල්පනයකිරීමට සිදුවනු ඇත. ඒ උපකල්පන දෙකෙන් කුමක් ගත්ත ද ඒ ආත්මවාදී වෙයි. පළමු උපකල්පනය උච්ඡෙදවාදය සමග ද දෙවැනි උපකල්පනය ශාස්වතවාදය සමග ද බැඳී ඇත.

අනෙක් අතට ලබ්ධිය සියල්ලට පළමු තීරණ ගන්නේ ය වැනි අදහසක් ද ලබ්ධි ප්‍රවාදයෙහි දී කියැවෙයි. අප යමක් කතාකරන්නේ හෝ ලියන්නේ හෝ වෙනත් දෙයක් උඩු සිතෙහි දැනුවත්කම ඇතිව කරන්නේ එය කලින් ලබ්ධිය මගින් තීරණය වීමෙන් පසුව යැයි ගැනීමට අපට සිදුවෙයි. මෙහි බැරෑරුම් කමක් වෙයි. අප තීරණ ගන්නේ සවිඥානික ව නොවෙය යන්න මෙයින් අවසානයේ දී ලැබෙන නිගමනය ය. අප සවිඥානික ව ලියන දේ එයට ස්වල්ප මොහොතකට හෝ කලින් ලබ්ධිය විසින් තීරණය කෙරී ඇත්නම් අපේ ක්‍රියාවල වගකීම අවිඥානික ලබ්ධියකට පටවා අපට නිහඬවිය හැකි ය. එවිට අප අපේ ක්‍රියාවලට වගකිවයුතු නො වෙයි.

මෙය අපේ ක්‍රියාවල වගකීම හෝමෝන හෝ වෙනත් භෞතික දෙයකට පැවරීම හා සමාන ය. හෝමෝන ක්‍රියාකාරීත්වයට හෝ මොළයේ යම් වර්ධනයකට හෝ අවවර්ධනයකට හෝ වෙනත් දෙයකට හෝ සියල්ල ඌනනයකිරීම අප වගකීම පැහැරගැරීමක් වනු ඇත. මෙහි ද ඇත්තේ ක්‍රිස්තියානි සංස්කෘතික සම්භවයකි. සියල්ල සිදුවන්නේ දෙවියන් වහන්සේගේ කැමැත්ත පරිදි නම් අපට සවිඥානික ව කළහැක්කේ කුමක් ද? ඒ දෙවියන් වහන්සේ ගැන විශ්වාසය ඇති කරගැනීම පමණක් යැයි කෙනකුට කිවහැකි ය. එහෙත් එලෙස දෙවියන් වහන්සේ ගැන විශ්වාසය ඇතිකරගැනීම ද දෙවියන් වහන්සේගේ කැමැත්ත පරිදි සිදුවන්නේ නම් අපට කළ හැක්කේ කුමක් ද? දෙවියන් වහන්සේ ගැන විශ්වාසයක් නොමැතිව ස්වර්ගයට යා නොහැකි නම් හා උන්වහන්සේ ගැන විශ්වාසයක් ඇතිකර ගතහැක්කේ ද  උන්වහන්සේගේ කැමැත්ත පරිදි නම් එහි කෙළවර ඇත්තේ දෙවියන් වහන්සේගේ කැමැත්ත පරිදි අප ස්වර්ගයට හෝ වෙනත් තැනකට හෝ යන බව ය. වෙනත් අයුරකින් පවසන්නේ නම් දෙවියන් වහන්සේ තමන්ගේ කැමත්ත පරිදි ඇතැම් පුද්ගලයන් ස්වර්ගයට ද සෙස්සන් අපායට ද යවති.

හෝමෝනවලට හා මොළයේ හා ස්නායු පද්ධතියෙහි ක්‍රියාකාරීත්වයට සියල්ල භාරදීමත් ලබ්ධියට සියළු ක්‍රියා භාරදීමත් අතර ඇත්තේ සුළු වෙනසක් පමණ ය. පළමු අවස්ථාවෙහි ද්‍රව්‍යවාදී පදනමක් ඇති අතර දෙවැනි අවස්ථාවෙහි ඇත්තේ විඥානවාදී ස්ථාවරයකි. ඒ ස්ථාවර දෙකම බටහිර නිර්මාණ වන අතර ඒ දෙවියන් වහන්සේ පදනම් කරගනිමින් ගොඩ නැගී ඇත. ඒ ස්ථාවර දෙකෙහිම තම අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා ඌනිතවාදී වීම, එනම් සියල්ල එක් කරුණකට පමණක් ඌනනයකිරීම, ඉතා ඉහළින් ක්‍රියාත්මක වෙයි. අවිඥානිකව ක්‍රියාකාරීවන ලබ්ධියකට සියල්ල භාරදීම හෝ ඌනනයකිරීම හෝ අපේ වගකීමෙන් අප නිදහස්කිරීමකි. අද බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වර්ධනයවෙමින් ඇත්තේ ඒ දිශාවට ය. බටහිරයන් අධිකරණයට ගොස් තමන්ට විරුද්ධව ඇති චෝදනාවලට වරදකරුවා හෝමෝන හෝ මොළයේ වෙනස් ආකාරයක වර්ධනයක් හෝ ලබ්ධිය යැයි කියන දිනය එතරම් ඈතක විය නො හැකි ය.

© Prof. Nalin De Silva

උඩු සිත හෙවත් සිතෙහි සවිඥානික කොටසට ඇති වැදගත්කම යටි සිතෙහි පාලනයට යටත්කිරීම සිත උඩුසිත හා යටි සිත යනුවෙන් කොටස් දෙකකට බෙදීම නිසා ඇතිවන ප්‍රතිඵලයක් විය හැකි ය. ඒ තත්ත්වය මගහරවා ගැනීමට ඇති එක් ක්‍රමයක් නම් උඩු සිත හා යටි සිත යනුවෙන් කොටස් දෙකකට සිත නොබෙදා සිත ඇතැම් අවස්ථාවල සවිඥානික වන්නේ යැයි ගැනීම ය. සවිඥානික වීම යනු අවශ්‍ය නම් උඩු සිත ක්‍රියාත්මකවීම යැයි ගත හැකි ය. සිත සවිඥානික නොවන අවස්ථාවන්හි ඒ අවිඥානික වෙයි. එනම් උඩු සිත, යටි සිත ආකෘතියට අනුව නම් යටි සිත පමණක් ක්‍රියාත්මක වෙයි.

දැන් ප්‍රශ්නය වනුයේ සිත අවිඥානික අවස්ථාවක ඇති විට පමණක් නොව සවිඥානික අවස්ථාවෙහි ද, අවිඥානික ව සිදුවන දේ සවිඥානික කරගැනීමට හැකි ද යන්නත් එසේ සිදුවන්නේ කෙසේ ද යන්නත් ය. උඩු සිත යටි සිත ආකෘතියට අනුව නම් යටි සිත උඩු සිතට යම් යම් දේ සන්නිවේදනයකරන්නේ කෙසේ ද යන්න ය. අප කලින් ද සඳහන්කර ඇති පරිදි මේ සඳහා සුදුසු ආකෘතියක් (ප්‍රවාදයක්) අප සතු නො වෙයි. එහෙත් අපට එලෙස සන්නිවේදනයක් වන බව නම් පැහැදිලි ය.

අප නිර්මාණකරන්නේ ද්විකෝටික න්‍යාය ආශ්‍රිත තර්කයෙන් නො වේ යැයි කලින් සඳහන්කර ඇත. එය ජ්‍යාමිතිය වැනි විෂයක දී මෙන් ම කාව්‍ය නිර්මාණයෙහි දී ද බලපැවැත්වෙයි. අවිඥානික ව සිදුවන නිර්මාණය අපි ඇතැම් විට සවිඥානික ව යම් යම් වෙනස්කම්වලට භාජනය කරමු. එහි දී ඇතැම්විට ද්විකෝටික න්‍යාය ආශ්‍රිත තර්කය යොදාගනිමු.  එසේත් නැත්නම් චතුස්කෝටිකය ආධාරකරගෙන අපි සවිඥානික ව තර්ක කරමු. අවිඥානික සිත තර්කකරන්නේ ද නැත් ද තර්ක කරන්නේ නම් එහි දී යොදාගැනෙන න්‍යායයක් වේ ද ආදී ප්‍රශ්නවලට පැහැදිලි පිළිතුරු අප සතු නො වෙයි.

අපි මෙහි දී උඩු සිත හා යටි සිත (මේ ආකෘතිය යොදාගැනීම පහසු වෙයි.) අතර ඇතිවන සන්නිවේදනය සඳහා උදාහරණයක් සලකා බලමු. අප සිහින දැකිමේදී සිදුවන්නේ කුමක් ද? එහි දී වෙනත් දේ අතර එක්තරා ආකාරයකට යටි සිත හා උඩු සිත අතර ඇතිවන සන්නිවේදනයක් අපි අත්දකින්නෙමු. අප දකින සිහිනවලින් අපට මතක ඇත්තේ ස්වල්පයක් පමණක් යැයි බටහිර මනෝ විද්‍යාඥයෝ පවසති. මෙහි දී මතකය යනුවෙන් අදහස්වන්නේ උඩු සිතට කැඳවාගත හැකි තොරතුරු ය. ඒ තොරතුරුවලට වඩා බොහෝ තොරතුරු යටි සිතෙහි තැන්පත් වී ඇති බව නො අනුමාන ය. එහෙත් ඒ සියළු තොරතුරු අපට උඩු සිතට කැඳවාගත හැකි නො වෙයි. එලෙස යටි සිතෙහි ඇති තොරතුරු උඩු සිතට කැඳවාගැනීමෙහි දී සිදුවන්නේ ද සන්නිවේදනයකි. මතකය වැඩි අයට අනෙක් අයට වඩා ඒ සන්නිවේදනය පහසුවෙන් කරගත හැකි ය. මතකය වැඩිකිරීම සඳහා කෙරෙන නොයෙක් උපක්‍රම ඒ සන්නිවේදනය වැඩිකිරීම සඳහා කෙරෙන ක්‍රියාවන් ලෙස හඳුනාගත හැකි ය.

යටි සිත අවිඥානික ව ක්‍රියාකළ ද ඒ ඒ පුද්ගලයාගේ යටි සිත විවිධ ආකාරයෙන් ක්‍රියාත්මක වන්නේ ඇයි? සැම පුද්ගලයකුට ම එක හා සමාන දක්ෂතාවයකින් කාව්‍ය නිර්මාණය කළ නොහැක්කේ ඇයි? ඒ ඒ පුද්ගලයාගේ ගණිත අන්තර්ඥානය (Mathematical Intuition) වෙනස්වන්නේ ඇයි? සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ඒ සඳහා ආකෘතියක් ගොඩනගා ගැනීම අපහසු නො වෙයි. එමෙන් ම එහි දී යටි සිතට ද තරමක වගකීමක් පැටවීමට ඒ ආකෘතිය ඔස්සේ අපට හැකිවෙයි. අපට යටි සිත යනු උඩු සිතට යම් යම් දේ ලබාදෙන හෝ උඩු සිත පාලනය කරන හෝ ප්‍රපංචයක් නො වෙයි. අපට උඩු සිත හා යටි සිත අතර සන්නිවේදනය එක් පැත්තකට පමණක් කෙරෙන්නක් ද නො වෙයි. යටි සිතෙහි සිට උඩු සිතට මෙන් ම උඩු සිතෙහි සිට යටි සිතට ද තොරතුරු හුවමාරු වෙයි. අපේ ප්‍රවාදයට අනුව උඩු සිත යටි සිතෙහි සේවකයෙක් නො වෙයි. උඩු සිත හා යටි සිත අතර ඇත්තේ දෙපැත්තකට සිදුවන සන්නිවේදනයකි.

ඒ ඒ අයගේ යටි සිතෙහි තැන්පත්වන්නේ උඩු සිතෙන් සවිඥානික ව කෙරෙන ක්‍රියා යැයි අපට සැලකිය හැකි ය. මේ තැන්පත් තොරතුරු සියල්ල අපට ආපසු උඩු සිතට කැඳවිය නො හැකි වුව ද යටි සිත ක්‍රියාකරන්නේ ඒ තොරතුරු මත පදනම් වී යැයි අපට උපකල්පනය කළ හැකි ය. ඒ උපකල්පනය හා අප අත්දකින දේ අතර පරස්පරයක් නැතිවීමත් ඒ සියල්ල සමස්තයක් ලෙස ගත්කල සංගතවීමත් අපට උපකල්පනය තහවුරුකිරීම සඳහා සෑහෙයි. ගණිත

© Prof. Nalin De Silva

අන්තර්ඥානය හෝ කාව්‍ය නිර්මාණයට ඇති හැකියාව හෝ එක් රැයකින් ඇතිකරගැනීමට නො හැකි ය. එයට සංසාරගත පුරුද්දක් අවශ්‍ය වෙයි.

සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ප්‍රවාදවල සංසාරගත පුරුද්ද යන්න අපට ඇතැම්විට යොදාගැනීමට සිදුවෙයි. සංසාරයක් ඇති බව පෙන්නුම් කරන්න යැයි අපට කී විට ඒ සඳහා බටහිර විද්‍යාවේ ප්‍රවාද මත පදනම් වී කරුණු ඉදිරිපත් කිරීමට උත්සාහ ගැනීමට වඩා කළ හැකි හොඳම දෙය සංසාරයක් නැති බව පෙන්නුම් කරන්න යැයි අභියෝග කිරීම ය. මරණින් මතු අඩුම තරමින් එක් භවයක හෝ පැවැත්මක් ගැන නුගැන්වෙන ආගමක් නැත. ආගමක් බිහිවන්නේ ම මරණින් මතු ඇතිවන භවය යහපත් එකක් කරගැනීම පෙරදැරි කරගෙන ය. එහෙත් බොහෝ ආගම්වල මේ භවයට පෙර භවයක් නොවී යැයි උපකල්පනය කෙරෙයි.

බටහිර විද්‍යාවේ ප්‍රවාදවල සංසාරයක්, මේ භවයට කලින් භවයක් නැතැයි උපකල්පනය කෙරෙයි. ඒ උපකල්පනය තහවුරු කළ අයකු පිළිබඳ ව මම නො දනිමි. ඒ උපකල්පනය යුක්තියුක්තකිරීම (justify) සඳහා බටහිර විද්‍යාඥයන්ට කිවහැක්කේ පෙර භවයක් ඇති බව නිරීක්‍ෂණයකර නොමැති බව පමණ ය. එහෙත් එය සංගත පිළිතුරක් නොවන්නේ ඔවුන් විසින් උපකල්පනය කෙරෙන ගුරුත්වාකර්ෂණ බලය ද නිරීක්‍ෂණය කළ අයකු නොමැති වීම හේතුවෙන් ය. කිසිවකු විසින්වත් නිරීක්‍ෂණය කෙරී නොමැති ගුරුත්වාකර්ෂණය ඇතැයි උපකල්පනය කෙරෙන්නේත් කිසිවකු විසින් නිරීක්‍ෂණය කෙරී නොමැති යැයි කියැවෙන පෙර භවය උපකල්පනයකිරීමට මැලිවන්නේත් බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික බලපෑම හේතුවෙන් මිස වෙනත් කරුණක් නිසා නො වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva